## 451 සන්තානා මැණියනේ දෙව් මව්ගෙ

සන්තානා මැණියනේ දෙව් මව්ගෙ මාතෘනේ
ජේසුස් තුමන් වෙතේ අප නිසා යාච්ඥා වේ

මව්නී ඔබෙ පිළිමා පිරිවර දණ නමා
තුතී පඬුරු පෙමා පුදමුය අපි සැමා

මව්නී ඔබෙ සරණා අයදින සැම දෙනා
ඉල්ලූ දෙය ලබනා නෙක ඔබෙ ගුණ වනා

මව්නී මේ දෙස තුලේ ක්‍රිස්තු සසුන බැබලේ
සුසිල ගුණ දිලේ පතමුය සැම කලේ